
# 12
# ක්‍රිස්තුස් වහන්සේ තුළ මම




ටපීඩළඩව ණරඩවටඩව - හඨ ණ;=ප දැතතව ටධඬවඬ.

තඣදඬව;ඣදණ - ඬඳටධයිණත= ණඬ ඊද ඩහඣදඊටඩව ඩව;%එඩත ණඬ හට.ඬව
ටදඣදඬවඬඨ ඡ,ච,ඬවටඬව ටතටඩව ධ@

ටපීඩළඩව ණරඩවටඩව - ටධරීඩඬව ණරඬවටඩවට.චු හඬඣදණ;ච
හඨ ණ;=ප දැතතව ටධඬවඬඥඩඑ ඊදඨ තඑඩඬවටඬව තණපත=
ධඥ ඩඑ
තඑඩඣද;ච ඊද ධඥඬ ඩඑදැටඩරඑ ඬබි ඊද ඊරඳට.ඬව ඡ,ච,ඬද
ඹඥ;.
බරීඨ ඊරඳ ඊදඨ ඨීණඬ ඡ,ඩ ටධඬඳ ඹඥ;.

ක්‍රිස්තුස් වහන්සේ මිනිසා සමඟ පෞද්ගලික ලෙස සබඳතාවකට නිතර ම ඇතුළු වන සේක. එයින් අර්ථවත් වන්නේ මිනිසාට පෞද්ගලික ව ම ක්‍රිස්තුස් වහන්සේ සමඟ සම්බන්ධ විය හැකි බව යි. එසේ ම ඉන් තම ජීවිතයට සැබෑ අර්ථයක් ලබා ගනිමින් ලෝකය ද අර්ථවත් කිරීමට ක්‍රියා කරන්නට ශක්තිය හා මඟ පෙන්වීම ලැබෙන බවයි.

ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ව පෞද්ගලික ව මුණ ගැසීමේ අත්දැකීම තුළ එතුමන්ගේ අනුගාමිකත්වයට හා ගෝලකමට පත් වූ තම ජීවන දර්ශනවල පෙරළියක් ඇති කර ගනිමින් ක්‍රියාකළ නිකදේමුස්, සාකෙවුස්, හා පාවුල් තුමා වැනි අයත් තවත් බොහෝ දෙනෙකුත් බයිබලීය චරිත අතර අපට හමු වෙයි.

## මොවුන් ලැබූ අත්දැකීම් මොනවා ද?

(කණ්ඩායම්වලට බෙදී නිකදේමුස්, සාකෙවුස් හා පාවුල් තුමා ලැබූ අත්දැකීම් අධ්‍යයනය කර සාමූහික ව බෙදා ගන්න.)

| | |
|---|---|
| නිකදේමුස් | ශු. ජොහාන් 3 : 1 15 |
| සාකෙවුස් | ශු. ලූක් 19 : 1 10 |
| පාවුල්තුමා | ක්‍රියා 9 : 1 19 |

## ක්‍රිස්තුස් වහන්සේ තුළ සබඳතාවය

සමාරියේ කාන්තාව හා ජේසුස් වහන්සේ අතර ඇති වන සංවාදය එදා සමාජය විශ්මයට පත් කරවන්නකි. ජුදෙව් හා සමාරිය පරතරය උසස් යැ යි සම්මත වූ ජුදෙව් ජාතියේ ජේසුස් වහන්සේ පහත් යැ යි සම්මත සමාරිය මැදින් යෑම කාන්තාවකගෙන් වතුර ඉල්ලීම ඒ අතර වේ. මේ මුණගැසීම තුළින් ඇති වූ ජීවිත වෙනස මෙන් ම එතුමා සමාරියේ නතර ව සිටීම ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත් වන්නකුගේ ජීවිතයට අභියෝගයක් වේ. ක්‍රිස්තුස් වහන්සේ තුළ තම ජීවිතය ගොඩනැංවීමේ දී මතු වන කරුණු කිහිපයක් තිබේ. මේ සබඳතාවය ඉතා ගැඹුරු පෞද්ගලික එකකි.

1 පුද්ගලයාට තම ජීවිත අභ්‍යන්තරික සැබෑ තත්ත්වය දකිනන්ට අවස්ථාවක් ලැබෙනු ඇත. (ජොහාන් 4 : 29 , ලූක් 19:8 ,ක්‍රියා 9 : 4 6 ) එවිට ජීවිතයේ සැබෑ වෙනස් කම් ඇති කිරීමට ශුද්ධාත්මයාණන් මඟ පෙන්වනු ඇත.

2 ක්‍රිස්තුස් වහන්සේ සමඟ පෞද්ගලික සබඳතාවය දිගින් දිගට තබා ගැනීම අවශ්‍ය වෙයි. එසේ නම් තමා ලැබූ නව ජීවන දර්ශන ලෝකය තුළ ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය ශක්තිය හා බලය ගිලිහී යනු ඇත. නිකදේමුස් තුළ ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය ශක්තිය හා බලය ගිලිහී යනු ඇත. නිකදේමුස් පළමු මුණගැසීමෙන් පසු ව ක්‍රිස්තුස් වහන්සේ කුරුසි පත්වීමේ දී (ජොහන් 19 : 39 42 ) එතුමන්ගේ ශරීරය සොහොන ගෙයෙහි තැන්පත් කරන්නට ඉදිරිපත් විය. එසේ ම පාවුල් තුමාගේ සේවයේ දී නොකඩවා යාච්ඥාව තුළින් තැබූ සබඳතාවය ( 2 කොරින්ත 12:810) එතුමාණන් ව ශක්තිමත් ව තැබූ බව පෙනේ.

3 එම පෞද්ගලික සම්බන්ධතාවයේ අත්දැකීම සමාජයීය ජීවිතයේ දී දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති තුළ ක්‍රියාත්මක කිරීමට ශක්තියක් උත්පාදනය කරනු ලබයි. ක්‍රිස්තුස් වහන්සේ තමන් ව පහත් නොකරන බව ද ප්‍රේමයෙන් පිළිගන්නා බව ද සමාරිය කාන්තාව එතුමා සමඟ ඇති වූ සංවාද තුළින් අත්දුටුවා ය. (ජොහාන් 4 : 9 , 39 40 )

එසේ ම සමාජය වෙනුවෙන් හාරදූර වගකීම් ගැනීමට ද මෙම අත්දැකීම් පොළඹවනු ලබයි. මේ විෂම සමාජයේ වෘකයන් අතර බැටළුවන් මෙන් ජීවත් වීමට (මතෙව් 10:16) කැඳවීමක් තිබේ. වෙනත් කුලවල, නිකායයන්වල, ජාතිවල අය පහත් නොකිරීම වැනි ක්‍රිස්තුස් වහන්සේ තුළ තිබූ යහපත් ගුණාංග ක්‍රිස්තුස් වහනසේ තුළ ජීවත් වන පුද්ගලයකු තුළ තිබිය යුතු ය.

4. මෙම සම්බන්ධතාවය පුද්ගලයාගේ ජීවිත අභ්‍යන්තරය තෘප්තිමත් භාවයෙන් පුරවයි . මෙය අතිශය පෞද්ගලික අත්දැකීමක් වනු ඇත. ඒ කරණ කොටගෙන මමත්වය නසන්නට ද තමා ජීවිතයේ මුහුණ දෙන සිදුවීම් දෙස නව දෘෂ්ටි කෝණයකින් බලන්නට ද මඟ පෑදෙනු ඇත.

## මේ පෞද්ගලික සම්බන්ධතාවයට ඇතුළු වුවකු දේවරාජ්‍යයේ ප්‍රතිපත්ති මත දිවි ගෙවන්නේ කෙසේ ද?

| | |
|---|---|
| පිලිප්පි 2 : 16 | දීප්තිමත්, පිරිසිදු, ශාන්ත සන අඳුර පලවා හරිමින් දිදුලන ආලෝකය දෙන තාරකා මෙනි. |
| 1 කොරෙන්ති 6 : 12 20 | ශරීරය හා මුළු පැවැත්ම ශුද්ධාත්මයාණන් වැඩ විසීමට සුදුසු පවිත්‍රත්වයෙන් තබා ගැනීමෙනි. |

## ක්‍රිස්තුස් වහන්සේ තුළ යොවුන් වියේ ජීවිත පෙරළියක් ............

සමාජය තුළ ඇති අඳුර අපිරිසිදු භාවයේ බැමි කපා හැරීමට ඇති අසීරුතාවය මහත් ය. නමුත් ලොව විමුක්තිය කරා ගෙන ඒමට කල්වාරියේ තම තරුණ වියේ දී ම කුරුසිපත් ව උත්ථානයෙන් නව බලාපොරොත්තු ගෙනා ජේසුස් වහන්සේ ආදර්ශයක් ව සිටිනු ඇත. ජීවමාන එතුමන් සමඟ දරණ පෞද්ගලික සම්බන්ධතාවය මෙසේ එතුමන්ගේ ගෝලකම තබා ගනිමින් පරාර්ථකාමී ලෙස ලොව සේවය කිරීමට මඟ පෙන්වයි.

යොවුන් වියේ දී ජීවිතය අපවිත්‍ර කරන බොහෝ දේ අද සමාජයේ පවතී. යොවුන් වියේ ජවය ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාමිත්වය තමා තුළ තබා පවිත්‍ර ව සිටිමින් ලෝකයේ පිවිතුරු කිරීමේ කාර්යයට යෙදවිය යුතු ය. මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්වැටි, අසභ්‍ය චිත්‍රපට හා තවත් බොහෝ දේ තරුණ ජීවිත විනාශය කරා රැගෙන යයි. මේ අපවිත්‍රතාවයෙන් ඉවත් ව සිටීම කිතුනු තරුණ තරුණියින්ගේ යුතුකම යි.

ක්‍රිස්තුස් වහන්සේ තුළ තබන මෙම පෞද්ගලික සම්බන්ධතාවය ඔබේ සියලු ම පෞද්ගලික සම්බන්ධතාවනට බලපෑමක් කරයි. ඔබේ නිවසේ සිටින අයවලුන්, මිතුරන් හා අවට සමාජය සමඟ පිවිතුරු සාමකාමී ක්‍රිස්තුස් වහන්සේ සතු ජීවිත ගුණාංග සහිත සම්බන්ධතා පවත්වන්නට ඔබ නිතැතින් ම පෙළඹෙනු ඇත. ඉන් අදහස් වනනේ ඔබේ ජීවිත පැවතුම්වල ක්‍රිස්තුස් වහන්සේ ව පිළිඹිඹු වීම යි.

මෙවැනි ජීවිත පෙරළියක් ඇති ව ලෝකය තුළ ධෛර්යමත් ව කටයුතු කළ බොහෝ අය සිටිති. ඒ අය අතරින් දේව ගැති මයිකල් රොද්‍රිගෝ දේවගැති, ජෝන් වෙස්ලි හා ඉව්ලින් කානි අපට සඳහන් කළ හැකි ය.

(පහත සඳහන් පුද්ගලයන් ක්‍රිස්තුස් වහන්සේ සමඟ පැවති ජීවිත සම්බන්ධතා තුළින් ඇති වූ ජීවිත පෙරළියත් ඔවුන්ගේ සේවාවන් ගැනත් සොයා බලන්න.)

දේවගැති මයිකල්
රොද්‍රිගෝ

විමර්ශණයක්
තුළින් ඡායාරූප
සහ දත්ත
සොයා ගන්න

............................
............................
............................

දේවගැති ජෝන්
වෙස්ලි



............................
............................
............................

ඉව්ලින් කානි

විමර්ශණයක්
තුළින් ඡායාරූප
සහ දත්ත
සොයා ගන්න

............................
............................
............................

මෙවැන්නන්ගේ ජීවිත තුළින් ක්‍රිස්තුස් වහන්සේ ව පිළිඹිඹු වේ. ඔවුන්ගේ සේවය ක්‍රිස්තුස් වහන්සේ සමඟ පෞද්ගලික ලෙස තැබූ සබඳතාවය නිසැක ලෙස ම මල්ඵල ගැන්වීමක් සේ දැකිය හැකි ය. ඒ අභියෝග අද යොවුන් ඔබ දැරීම කිතුනු ගෝලත්වය තුළින් අපේක්ෂා කෙරේ.

**" එබැවින් ඔබ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ස්වාමීන් වහන්සේ වශයෙන් පිළිගෙන තිබෙන බැවින් උන්වහන්සේ හා ඒකාබද්ධ ව ජීවත්වන්න. උන්වහන්සේ තුළ මුල් ඇද ගත් පරිදි ස්ථිර ව ම සිටින්න. උන් වහන්සේ මත ඔබේ ජීවිත නිර්මාණය කරන්න. ඔබට උගන්නවන ලද ඇදහිල්ලෙහි පිහිටා සිටින්න. "**

**කොලොස්සි 3 : 6**

❖ **ඇගැයීම :-**

1. ක්‍රිස්තුස් වහන්සේ සමඟ පවතින පෞද්ගලික සම්බන්ධතාවය මත දේව රාජ්‍යයේ යහ ගුණ ක්‍රියාත්මක කිරීමට ඔබට ඇති බාධක හා ගැටළු වගු ගත කරන්න.

| පෞද්ගලික ජීවිතයේ | පවුලේ | සමාජයේ | පාසලේ |
|---|---|---|---|
| | | | |
| | | | |

2. ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඇති සබඳතාවය ඔබේ ජීවිතයේ ඇති වූ පෙරළිය නිසා සමාජයේ කිනම් මෙහෙවරක යෙදෙන්නට ඔබ අදහස් කරන්නේ ද?